# ඔවුහු සමාජය වර්ණවත් කළහ

ශ්‍රීනාත් මද්දුමගේ

ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකීය සමාජය ඔපවත් කරන්නට නන් අයුරින් දායක වෙමින් දිගු කාලීන සම්පත් මෙහෙවරක නිරත වූ අපේ කාලයේ මාතාවන් තිදෙනෙකුට උපහාර පිදීමේ උත්සවයක් පසු ගිය ජූනි මස 26 වැනිදා මෙල්බර්න් හි ස්කැට්ස් සංවිධානයේ සංවිධානත්වයෙන් පවත්වන්නට යෙදුනි.

මේ සසර ගමනේ  අප මේ ගත කරන්නාවූ කෙටි නවාතැන අර්ථවත් එකක් කරනුයේ රැස් කරන්නා වූ මිළ මුදල් නොව අප ඉතිරි කරගන්නා වූ ගුණ සුවඳට බව පසක් කරමින් එදින, එම මාතාවන් තිදෙන ජනතා උපහාරයෙන් පිදුම් ලැබූහ. අප සමාජයට පරමාදර්ශයක් බඳු එම මාතාවන් පිළිබඳව මෙසේ සටහනක් තැබීම මා සතු යුතුකමක් ලෙස සලකමි.

මෙල්බර්න් සමාජයේ කලාවට හිතැති දූ පුතුන්ගේ වේදිකා ආගමනයට මං පෙත් හෙළි කළ මාලිනී ජයසිංහ මැතිණිය ලොකු කුඩා කාගේත් ගෞරවාදරයට පත් වූ සමාජ සේවිකාවක් වූවාය. මෙල්බර්න් හි ප්‍රථම වරට -නරිබෑණා" -බක් මහ අකුණු" -හුණුවටයේ කතාව" වැනි වේදිකා නාට්‍ය ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිකරගත් ජයසිංහ මාතාව මෙල්බර්න් හි -මනමේ" හා මහාසාර නාට්‍ය නිශ්පාදනයන් ට උර දුන්නාය. සංගීතයට මහත්සේ ඇළුම් කළ ඈ රංගන ශිල්පිනියක වූවාය.

දිගු කාලයක් පුරා ස්කැට් සංවිධානයේ සභාපති හා ලේකම් තනතුර හෙබවූ ජයසිංහ මැතිණිය එම සංවිධානය තුලින් මෙල්බර්න් සමාජයට පමණක් නොව ශ්‍රී ලාංකීය සමාජයට විශාල මෙහෙවරක් ඉටු කිරීමට දායක වූවාය.

ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකීය කලා කෙත අස්වද්දන්නට මාලිනී ජයසිංහ මැතිණිය ගෙන් වූ අනුපමේය සේවයක්. ආචාර්ය වරියක හා සමාජ සේවිකාවක් ඉටු  කලා වූ සේවයක් වෙනුවෙන් මෙම සටහන තුති මල් මිටක් වේවා.

දශක දෙකකට පෙරාතුව සිටම මෙල්බර්න් හි වෙසෙන ශ්‍රී ලාංකීය දරු දැරියනට සිංහල ඉගැන්වීමේ භාර දූර කාර්ය භාර්යට උරදුන් දේවිකා රූපසිංහ මැතිණිය මෙල්බර්න් 3''' ප්‍රජා ගුවන් විදුලි සේවයේ ආරම්භක නිවේදිකාවක වූවාය. ගුවන් විදුලියේ ලමා නාට්‍ය නිවේදිකාවක වශයෙන් සදා නොමැකෙන සේවයක් ඉටු කළ රූපසිංහ මැතිණිය මෙල්බර්න් ශ්‍රී ලාංකීය දූ දරුවන්ට නර්තනය ඉගැන්වීමෙහි ලා පුරෝගාමී වූ මෙහෙවරක් ඉටු කලාය. සංගීතයටත් රංගනයටත් ඇලුම් කල රූපසිංහ මාතාව මෙල්බර්න්හි  ශ්‍රී ලාංකීය ප්‍රජාවේ සියලු සමාජ කර්තව්‍යයනට සිය නොමසුරු සහයෝගයක් ලබා දුන්නාය.

ශ්‍රී ලංකාවේ ආචාර්යවරියක වශයෙන් දිගු කලක් සේවය කල රමණි ලියනාරච්චි මැතිණිය මෙල්බර්න් හි ලක් දූ දරුවන්ගේ සිංහල අධ්‍යයනය වෙනුවෙන් සිය ඉතිරි ජීවිත කාලය කැප කළ මාතාවක් වූවාය. වික්ටෝරියානු රජයේ ආධාර ලබාගෙන මෙල්බර්නි සිංහල භාෂා ඉගැන්වීම ස්ථාපිත කරන්නට පුරෝගාමී මෙහෙවරක යෙදුනු ලියනාරච්චි මාතාව මෙල්බර්න්හි ලක් දූ දරුවන්ට ප්‍රථම වරට වික්ටෙ-

20 පිටට







## සිඩ්නි සිට ලියමි

මින් වසර එකහමාරකටත් වැඩි කාලයකට ඉහත සිනුවර හසුන තීරු ලිපිය සන්නස මාසික සඟරාවේ පලකිරීම ඇරඹීමේදී මගේ මූලික අභිප්‍රාය වූයේ සිනුවර හෙවත් සිඩ්නි නගරයේ යහගුණ විසිතුරු, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන්නන් ගේ දැනගැනීම පිණිස මනා ලෙස සකසා ඉදිරිපත් කිරීමයි.
සිඩ්නි නුවර, සිනුවර ලෙසින් නම් කලේ සිනුවර වාසී කවියෙකු සහ ලේඛකයෙකු වන හෙන්රි කුමාරප්පෙරුම මහතා 2005 වසරේ දී ඔහු ලියූ කවි පන්තියක් මගිනි. පසුගිය ජූනි මාසයේ සිනුවර හසුන සිනුවර වෙසෙන ඔහු වැනි සිංහල කවියන් සහ ලේඛකයින් පිළිබඳ සටහනක් තැබීමට වෙන්විය.
ඒ කර්තව්‍යය අද තවත් පියවරක් ඉදිරියට ගෙනයමින්, මෙවර සිනුවර හසුනින් තම ගායන කුසලතාවයන් තමන්ගේම ගී තැටි මගින් අපට තිලිණ කර ඇති සිඩ්නි නගරයේ වෙසෙන සිංහල ගායක ගායිකාවන් ඔබට හඳුන්වා දීමට මම අදහස් කරමි.
මෙහිදී මගේ සිහියට මුලින්ම එන්නේ දශක දෙකක පමණ කාලයක් තිස්සේ සිනුවර ප්‍රසංග වේදිකාවේ ගී ගයන බොනී ප්‍රනාන්දුය. බටහිර ගී ගයමින් ලංකාවේ දී තම ගායන දිවිය ඇරඹූ බොනී ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර ජෙම්ටෝන් ලේබලය යටතේ ගී හතරක තැටියක් නිකුත්කර ඇති අතර 1996 දී -නාමල් වසන්තේ" සහ 2006 දී "රෑ රැජිණන්" සංඝත තැටි යුගල සිංහල ගී ලොවට ඉදිරිපත් කලේය.
මා මින් පෙර සිනුවර හසුන කොලමක ලියූ " සෙබලිය" සංගීත ප්‍රසංගය 2009 දී සිනුවර සංවිධානය කළ ශ්‍රියානි අබේනායක සිය කුළුදුල් ගී තැටිය "සොඳුරු සිහින" නමින් 2008 වසරේ එළි දැක්වූවාය. ඇගේ මූලිකත්වයෙන් සිනුවර පිහිටුවා ඇති මුතුහර රූපවාහිනී ළමා සමාජය මගින් ශ්‍රියානි තම ගායන කුසලතාවයන් ඉදිරි පරපුරට දයාද කිරීම සඳහා මේ දිනවල කටයුතු කරමින් සිටින්නීය.
විශාරද සනත් නන්දසිරි ගේ ශිෂ්‍යාවක් වන ප්‍රසාදිකා වික්‍රමආරච්චි තම "රං කිරිල්ලී" සංගත තැටිය සිඩ්නි ගී අඹරට එකතු කලේ 2009 වසරේ දී ය.
කුඩා දරුවෙකු ලෙස සිනුවර ප්‍රසංග වේදිකාවල ගී ගායනා කරමින් අප අතරට ආ නිසා ළමා ගායක තිසල් පාදුක්කවිදන ද පසුගිය වසරේ දී -මගේ උරුමය" නමින් සංගත තැටියක් නිකුත් කලේය.
සිනුවර සංගීතඥයෝ කිහිප දෙනෙකු ද වෙසෙති. "දිලි දිලි සඳ දිලි දිලී" නමින් සිය මුල් ගී එකතුව 1995 දී ඉදිරිපත් කළ සංගීත විශාරද ඉන්දු ප්‍රේමතිලක වෙනත් ගායක ගායිකාවන් ගේ ගීත ගණනාවකටම සංගීත නිර්මාණය කර ඇත.
සංගීත විශාරද තුෂාරී එදිරිසිංහ ද එලෙසම ගීත සඳහා සංගීත නිර්මාණය කර ඇති සිනුවර වෙසෙන සංගීත ශිල්පිණියෙකි.
සිනුවර මීට පෙර නිපදවුණු "සයුරු වළල්ලෙන්" සහ "සැරදේ ලංකා" ගී තැටි යුගල සඳහා සංගීතය සැපයූ සිසිල් ෆොන්සේකා ද මේ සංගීතඥයින් අතරට එකතු වේ.
මේ සියළු කරුණු සමගින් සන්නස පාඨකයින්හට ඉදිරිපත් කළ හැකි තවත් සුවිශේෂී කාරණා ද්විත්වයක් ද වේ.
ඉන් පළමුවැන්න නම්, ශ්‍රී ලංකාවේ අද්විතීය සංගීතඥයෙකු වූ ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න, පසුගිය දිනවල තමා විසූ -මෙ-පුරෙන්" නික්ම, මේ දිනවල සිනුවර තදසන්නයේ වෙසෙමින් ගී රස හඳුණන සිනුවර වැසියනට තම ඥාණය බෙද හද දෙන බවයි. ඔහු ගේ ආශිර්වාදයෙන් තවත් ගායක ගායිකාවන් රැසක් අනාගතයේදී සිනුවර බිහිවෙනු ඇති බව නිසැකය.
දෙවැන්න නම්, සිනුවර වෙසෙන ලේඛක, සංගීතඥ, ගායක පරපුරේ සාමූහික ප්‍රයත්නයක් ලෙසින් නිපදවෙන සිනුවර ගී පදමාලා, සිනුවර සංගීතය හා මුසුව සිනුවර හඬින් ගැයෙන සිනුවර ගී අඩංගු සංගත තැටියක් මේ වෙනවිට නිපදවෙමින් තිබෙන බවයි.
මේ සුවිශේෂී ගීත සංචිතය අගෝස්තු මස 22 ද සිනුවර දී දෙරට වැඩීමට නියමිත බව ඔබ සැමට මෙලෙස සතුටින් දැනුම් දෙමි.

**සිනුවර ආරච්චිල**
<sinuwara.arachchila@gmail.com>